මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ - 2 කොටස පිළිබඳ ව්‍යාපෘතිය - 2022

-----------------------------------------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ - 2 කොටස පිළිබඳ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 18 දින එළඹි අංක 3625- එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 4.02 (අ) වගන්තිය සහ එළඹි අංක 3626 - එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුමේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

වැඩසටහනේ පරමාර්ථය වන්නේ වැඩසටහන් ප්‍රදේශයේ කෘෂිකාර්මික, පානීය හා වාණිජ කටයුතු සඳහා ජල සම්පත් සඳහා ආරක්ෂිත ප්‍රවේශයයි. උතුරු මැද පළාත් ඇළ ව්‍යාපෘතිය, වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය, මිනිපේ වම් ඉවුර ඇළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන අංග තුනක් යටතේ වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 242 ක් වූ අතර එය රු. මිලියන 38,177.67 ක් වන අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 210 ට සමාන රු. මිලියන 33,129.39 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල රු. මිලියන 5,048.28 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ.

වැඩසටහන 2017 දෙසැම්බර් 13 වන දින එහි කටයුතු ආරම්භ කර 2021 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3** මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2 භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (අ) **2020 - 2027** අතර නිම කිරීමට බලාපොරොත්තු වෙන් උතුරුමැද පළාත් මහා ඇළ ව්‍යාපෘතිය යටතේ කොඳුරුවාව සිට නාමල්පුර දක්වා කිලෝමීටර් **27.7** ක දුරකින් යුත් උමං ජල මාර්ගයක් ඉදිකිරීම සඳහා විදේශීය සමාගමක් සමඟ **2020** දෙසැම්බර් **15** වන දින මුළු වටිනාකම රු. මිලියන **40,073** ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ. | | |
| (i) **2** වන වාරිකය සඳහා අත්සන් කරන ලද ණය ගිවිසුමට අනුව **2021** දෙසැම්බර් **31** වන දින වැඩසටහන අවසන් කිරීමට නියමිතව තිබුණද, කොන්ත්‍රාත්තුව පිරිනැමීම වසර **2 ½** ක ප්‍රමාදයක් හේතුවෙන්, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ දිනය **2027** මාර්තු **10** දක්වා දීර්ඝ කර තිබුණි. | **2017** දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර තිබුණද, "උමාඔය" ව්‍යාපෘතියේ ජලය ඇතුළුවීමේ ගැටළු හේතුවෙන්, වසර **2 ½** ක ප්‍රමාදයක් ඇති කළ සැලසුම ඇතුළුව මෙම ව්‍යාපෘතිය සමාලෝචනය කිරීමට පාර්ශවකරුවන් සහ රජය තීරණය කර තිබුණි. | **ADB** සමඟ සාකච්ඡා කර අමතර අරමුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) කොන්ත්‍රාත් කාලසීමාව **2025** ජූනි **7** දක්වා කඩිනම් කිරීම සඳහා **2021** ඔක්තෝම්බර් **7** වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, **2** වැනි උමං විදින යන්ත්‍රයක් **2022** ඔක්තෝම්බර් මාසයේදී රු.මිලියන **6,691** මිලට ගෙන තිබුණි. කෙසේ වෙතත්, රට තුළ පවතින ආර්ථික අර්බුදය සහ අමතර මුදල් කඩිනමින් ලබා ගැනීමේ අභියෝග හේතුවෙන්, **2023** අප්‍රේල් **03** දිනැති අංක **23/0533/623/014** අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, අලුතින් ආනයනය කරන ලද උමං විදුම් යන්ත්‍රය **2024** මාර්තු දක්වා අක්‍රියව තැබීමට තීරණය කර තිබුණි. එබැවින්, දෙවන විදුම් යන්ත්‍රය සඳහා දරන ලද වියදම මෙම කාලය අදාලව නිෂ්කාර්ය විය. | කෙසේ වෙතත්, **ADB** වෙතින් අරමුදල් සඳහා අනුමැතිය ලබා ගනිමින් දෙවන විදුම් යන්ත්‍රය **(TBM-2) 2023** ඔක්තෝම්බර් මාසයේදී ආරම්භ කිරීමට සාකච්ඡා කෙරෙමින් පවතී. | දෙවන උමං විදින යන්ත්‍රය ඵලදායි ලෙස භාවිතා කිරීමට නිසි සැලැස්මක් සකස් කළ යුතු අතර සැලැස්මට අනුව යන්ත්‍රය ක්‍රියාත්මක කළ යුතුය. |
| (iii) සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර දෙකක් ගත වුවද උමගේ මීටර් **50**ක් පමණක් නිම කර තිබූ අතර ඉදිකිරීම් ප්‍රගතිය සියයට **10**ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | පළමු විදුම් යන්ත්‍රය **(TBM-1)** යන්ත්‍රය නිෂ්පාදනය කිරීම සහ එම යන්ත්‍රය එම ස්ථානයට ලබා දීම සඳහා, ඉදිකිරීම් වැඩසටහනට අනුව වසරකට ආසන්න කාලයක් ගත විය.<br>ආනයන සීමා කිරීම හේතුවෙන් පුපුරණ ද්‍රව්‍ය නොතිබීම නිසා **TBM** යන්ත්‍රය සවිකිරීමට | නව කාල රාමුවක් නියම කිරීමට සහ කාල රාමුව තුළ කාර්යය සම්පූර්ණ කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රවේශ පතුවළ සහ උමග දිගේ අවශ්‍ය දිග ලබා ගැනීමට ප්‍රමාද විය.<br>2023 වර්ෂයේ ආරම්භයේ සිට මේ දක්වා පළමු විදුම් යන්ත්‍රය TBM-1 උමං දිග මීටර් 1110ක විදුම් කර ඇත. | |
| (ආ) | වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය යටතේ මහකිතුල ආදාන උමග, මහකිතුල සහ මහකිරුළ ජලාශ සහ පෝෂක ඇල මහකිරුළ ජලාශ ඉදිකිරීම සඳහා රු. මිලියන 9,978 ක පිරිවැයකින් 2024 වන විට නිම කිරීම සඳහා විදේශීය සමාගමකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, වසර 2 ක කාලය තුළ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි මීට ප්‍රධාන වශයෙන් නිසි කාර්ය මණ්ඩලයක් නොමැතිකම, ප්‍රමාණවත් ඉදිකිරීම් උපකරණ නොමැතිකම සහ දුර්වල වැඩබිම් කළමනාකරණය හේතු වී තිබුණි. මෙම අසතුටුදායක තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කරමින් තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුට දැනටමත් රු. මිලියන 1,197 ක් සහ නිම කරන ලද වැඩ සඳහා රු. මිලියන 355 ක් ගෙවීම් කර තිබුණි. | කොන්ත්‍රාත්තුව 2023 මැයි 11 දින අවසන් කරන ලදී. අත්තිකාරම් ගෙවීම සම්පූර්ණයෙන්ම අයකරගෙන ඇත | (i) ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයට අනුව නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම<br>(ii) කොන්ත්‍රාත්කරු අසාදු ලේඛණ ගත කළ යුතුය<br>(iii) කාර්ය සාධන සහතික සඳහා රුපියල් මිලියන 459.18 ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 3.021 ක් අය කළ යුතුය. |
| (ඇ) | කොටස 03 සම්බන්ධයෙන්, සැලසුම් කර තිබූ කොන්ත්‍රාත් පැකේජ 09 න් කොන්ත්‍රාත් පැකේජ 6 ක් සඳහා කොන්ත්‍රාත්කරුවෙකු රු. මිලියන 1.7 ක මුදලකට 2 කොටස යටතේ ලැබී තිබූ ප්‍රතිපාදනවලින් තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත්, 3 වන කොටස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ණය ප්‍රතිපාදන ලබා දී නොතිබූ බැවින් කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර ප්‍රසම්පාදන කටයුතු සඳහා 2 වන කොටස යටතේ දරන ලද වියදම් යොදා ගැනීමට හේතු වී තිබුණි. | 2021-2022 කාලසීමාව තුළ රට තුළ පැවති වසංගත තත්ත්වයන්, 3 වන කොටස යටතේ අවශ්‍ය මුදල් සහ අතිරේක අරමුදල් අපේක්ෂා කළ පරිදි නොලැබීම හේතුවෙන් එම තත්ත්වය අපට පාලනය කළ නොහැකි විය. එබැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දරන ලද පිරිවැය නිෂ්ක්‍රීය වීම වැළැක්විය නොහැකි විය. | මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව 3 වැනි කොටසේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය ආරම්භ කළ නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | කළුගඟ ජලාශයේ සිට මොරගහකන්ද ජලාශයට ජලය ගෙන ඒම සඳහා කිලෝමීටර් 8.83 ක් දිග උමගක් කැණීමේ කොන්ත්‍රාත්තුවක් 2018 - 2021 වසර තුළ නිම කිරීමට රු. මිලියන 7,146.91 ක් විදේශීය සමාගමකට ලබා දී තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.<br>(i) කොන්ත්‍රාත් කාලය 2022 ජූලි 16 දක්වා දීර්ඝ කර ඇත.<br>(ii) සමාලෝචිත වර්ෂය අවසන් වන විට | රටේ පවතින ඉන්ධන අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් සත්‍ය ආරම්භක දිනය ප්‍රමාද විය. වැඩසටහනේ ප්‍රමාදයට ප්‍රධාන හේතු ලෙස ඉන්ධන, ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ශ්‍රම සංචලතා ගැටළු. කොන්ත්‍රාත්තුවේ දීර්ඝ කරන ලද දිනය 2022 ජූලි 16 වන | හැකි ඉක්මනින් කොන්ත්රාත්තුව අවසන් කිරීමට කොන්ත්රාත්කරුන් සහ උපදේශන සමාගම ලිඛිතව දැනුම් දිය යුතුය. |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ කාර්ය සාධනය සියයට **82** ක් වූ අතර **2022** වසරේ ඉදිකිරීම් ප්‍රගතිය වූයේ සියයට **12** ක් පමණි. | අතර, ගිවිසුම අවසන් වන විට කොන්ත්‍රාත්තුවේ පුරෝකථනය කළ මුදල රුපියල් බිලියන **8.25** කි. | |
| **(iii)** කොන්ත්‍රාත්තුවේ මිල වෙනස්කම් සඳහා රුපියල් මිලියන **274.5**ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන **506.98** ඉක්මවා මිල විචලනය ලෙස රු. මිලියන **781.48**ක් ගෙවා තිබුණි. | | |
| **(iv)** තවද, ඉදිරියේදී කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඇ. ඩොලර් මිලියන **35** (රු. මිලියන **12,600**) දක්වා වැඩි වීමට නියමිත බව පුරෝකථනය කර තිබුණි. | | |

**2.2** ව්‍යාපෘතියේ අරමුණෙන් බැහැරව සිදු කරන ලද ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| **2022/2023** කන්නයේ වී වගාව සඳහා ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්තු **02**ක් සඳහා වෙන් කර ඇති ඇ. ඩො. මිලියන **140**න් ඇ. ඩො. මිලියන **39**ක් සහ ඊට අමතරව ඇ. ඩො. මිලියන **50**ක් කෘෂිකාර්මික යෙදවුම් මිලදී ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කර තිබුණි. එයින් රු. මිලියන **14,202**ක් වැය කර පොහොර මෙට්‍රික් ටොන් **41,876**ක් ආනයනය කර තිබුණි. කිලෝග්‍රෑම් **50** බෑග්වල අසුරන ලද මෙම සම්පූර්ණ පොහොර තොගය රජයට අයත් පොහොර සමාගම් **02**ක් මගින් **2022** දෙසැම්බර් **5** වන දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ පිළිබඳව කිසිදු තහවුරු කිරීමක් සිදු කර නොතිබුණි. තවද, පොහොර මෙට්‍රික් ටොන් **161.5**ක (බෑග් **3,230**) හිඟයක් පැවති අතර එම පොහොරවල වටිනාකම රු. මිලියන **55.233** ක් විය. මේ සම්බන්ධය විසඳුමක් ලබා දීමට කටයුතු කර නොතිබුණ අතර ඒ පිළිබඳව අවධානයද යොමු කර නොතිබුණි. | **2022** සැප්තැම්බර් **23** වැනි දින වාරිමාර්ග අමාත්‍යාංශයේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය රසායනික පොහොර මෙට්‍රික් ටොන් **40,000**ක් **(MOP)** මෙට්‍රික් ටොන් **1**කට ඇමෙරිකානු ඩොලර් **950**ක මිලකට සැපයීමට සමාගමක් සමඟ ගිවිසුමකට එළැඹ තිබුණි. ඒ අනුව පොහොර ඇණවුම් කරන ලද අතර තොග **2022.12.02** දින කොළඹ වරායට පැමිණ තිබුණි. නැව් නියෝජිත සමාගම **PRUDENTIAL SHIPPING LINE (PVT) LTD** විසින් දැනුම් දෙන පරිදි. සැපයුම්කරු විසින් ලංකා බැංකුව හරහා ඉදිරිපත් කළ බඩු තොගයේ බිල්පතට අනුව පොහොර මෙට්‍රික් ටොන් **41,876**ක් (එම්ඕපී) සපයා ඇති බව සඳහන්ව ඇත. අපගේ ලිපියට අනුව අංක. **2022** දෙසැම්බර් **5** දිනැති **MI/MWSIP/PMU/PRO/MOP/** පොහොර අනුව පොහොර තොගය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත භාර දීමට කටයුතු කරන ලදී.<br>කැබිනට් උපදෙස් පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් බෙදා හැරීමේ ක්‍රියාවලිය සිදු කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නිකුත් කරන ලද දෛනික බෙදාගැරීමේ නිවේදනයේ දැක්වෙන්නේ ලැබුණු සහ භාරදුන් පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් **41,876**ක් බව සඳහන්ව ඇත. කිලෝග්‍රෑම් **50** ක බෑග්වල දෛනික බෙදා හැරීම් ප්‍රමාණය සහ බෙදා හැරීම් ගණන නිකුත් කළ බෑග් ප්‍රමාණය සැබෑ බෑග්වලට වඩා අඩුවෙන් නිකුත් කිරීමට සිදු විය. එබැවින් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ඇසුරුම් ක්‍රියාවලියේදී මෙම හිඟය ඇති වී තිබේ. | පොහොර හිඟය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. |

**2.3 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2018 මැයි 18 වන දින අංක 3625 ණය ගිවිසුම අත්සන් කරන තිබුණ අතර එමගින් සම්පූර්ණ ගිවිසුම් පැකේජ 2 ක එකතුව ඇ. ඩො. මිලියන 140.47 ක කටයුතු ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණේ, ණය ගිවිසුම අත්සන් කර වසර 2 ½ කට පසුව, 2020 දෙසැම්බර් මාසයේදී පමණය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු බැදීම් ගාස්තු රු. මිලියන 113.19 ක් 2018 නොවැම්බර් 15 සිට 2020 නොවැම්බර් 15 දක්වා ආසියානු සංවර්ධන බැංකුවට ගෙවීමට සිදු වී තිබුණි. | නිර්දේශිත පරිදි සිදු කළ යුතු නැවත ලංසු තැබීමේ ක්‍රියාවලිය හේතුවෙන් UECP-ICB-1 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ප්‍රමාද විය. CML-MTD දුර්වල මූල්‍ය තත්වයක පැවති අතර එය එම කොන්ත්‍රාත්කරුට දැනටමත් ලබා දී ඇති UECP-ICB-1 කොන්ත්‍රාත්තුවේ බලපෑමට ලක් විය.<br>කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදයට ද හේතු වූයේ 2019 දී අපේ රට මුහුණ දුන් Covid-19 වසංගතය හේතුවෙන් 2022 දී රට තුළ ආර්ථික අවපාතයකට මුහුණ දීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් අඩු නිදහස්කර ගැනීමක් සිදු වී ඇත. | නියමිත කාලය තුළ අදාළ කාර්යයන් සඳහා ණය භාවිතා කළ යුතුය. |